# අත්හැර දමන ලද උඩරට ටැම්පිට ප්‍රතිමා ගෘහ

## (මහනුවර දිස්ත්‍රික්කයේ අරත්තන විහාරය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්)

යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න

පුරාවිද්‍යාව අධ්‍යනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය

*shehanthilakarathna1205@gmail.com*

**ප්‍රමුඛ පද:** ටැම්පිට විහාර, භාවිතාව, සිතුවම්, ප්‍රතිමා, ප්‍රතිමා ගෘහය

### හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ ටැම්පිට විහාර 165ක් පමණ පවතින බවට තොරතුරු වාර්තා වී තිබේ. එහෙත් වර්තමානය වන විට ඒ අතරින් හොඳ තත්ත්වයෙන් පවතින්නේ විහාර 135ක් පමණ ය.මේ අතුරන් උඩරට ප්‍රදේශවල ටැම්පිට විහාරවල ඉහළසනත්වයක් දැකගත හැකිය. නමුත් අද වන විට එම ටැම්පිට විහාරයන් අතුරින් ඇතැම් ඒවා භාවිතයෙන් ඉවත්ව ගොස් හුදකලා තත්ත්වයකට පත්ව තිබෙනු හඳුනාගත හැකිය. එවැනි ටැම්පිට විහාර මන්දිර දෙකක් වන අරත්තන සහ කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ යන විහාරයන් දෙක මූලික කරගනිමින් ඒවායේ ඓතිහාසික වැදගත්කම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් අපේක්ෂා කෙරේ.

### ක්‍රමවේදය

මෙම විහාරස්ථානයන් දෙකෙහි ඓතිහාසිකත්වය පිළිබඳව අධ්‍යයනය කරමින් එහි පවතින ටැම්පිට ප්‍රතිමා ගෘහයෙහි සිතුවම් සහ පිළිම නිර්මාණයන්ගේ කලාත්මක අගය පිළිබඳව අවධානයට ලක් කරන ලදි. ඒ අනුව මෙම විහාරයන් දෙක අතුරින් මහනුවර අරත්තන විහාරයේ ඇති ටැම්පිට විහාර මන්දිරය මහනුවර යුගයේ සිතුවම් නිර්මාණකරණය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී උඩරට කලාපයේ වැදගත් වන ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකි ය. මාවනැල්ලේ කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරය මහනුවර යුගයේ පසුකාලයට අයත් වන්නකි. එය ඉදිකිරීම ටැම්පිට විහාර සම්ප්‍රදාය මහනුවර යුගයෙන් පසුව ඉදිරියට විකාශනය වීමේ අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. අදාළ ක්ෂේත්‍රයන්ට ගොස් ඒවායේ සිතුවම් සහ පිළිම නිර්මාණය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. තවද, එම විහාර මන්දිරවල ඉදිකිරීම් තාක්ෂණය, නිර්මාණ තාක්ෂණය, වර්තමාන තත්ත්වය පිළිබඳව ද අවධානය යොමු කරමින් අධ්‍යයනය සිදු කළ බැවින් එහි පවතින ඓතිහාසික වටිනාකම පැහැදිළි අවබෝධයක් ලබා ගත හැකිවිය.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම විහාරස්ථානයන් දෙකෙහි ම පවතින ටැම්පිට ප්‍රතිමා ගෘහයන් මේ වන විට භාවිතයෙන් ඉවත්ව යමින් තිබෙන බවට හඳුනාගත හැකි ය. අරත්තන ටැම්පිට විහාරය තේ වත්තක් මධ්‍යයේ පිහිටා තිබෙන අතර කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරය රබර් වත්තක් මධ්‍යයේ පිහිටා තිබේ. විහාරාධිපති හිමියන් වාසය කරන පන්සලෙන් වෙන්ව වෙන ම ස්ථානයක මෙම ප්‍රතිමා ගෘහයන් පවතියි.

එනිසා විහාරස්ථානයට පැමිණෙන දායකයන්ගේ අවධානය මෙම ප්‍රතිමා ගෘහයන්ට යොමු නොවේ. විහාරස්ථානයේ පවතින ජීවමාන උරුමයක් වශයෙන් ප්‍රතිමා ගෘහය දක්විය හැකි ය. විහාරස්ථානයට පැමිණෙන්නන්ගේ වන්දනාවට පුද පූජාවට එය නිරන්තරව ලක්වේ. එහෙත් මෙම ටැම්පිට ප්‍රතිමා ගෘහයන් එලෙස වන්දනාවට පුද පූජාවට ලක් නොවේ. නමුත් මෙම ප්‍රතිමා ගෘහයන් උඩරට කලා සම්ප්‍රදාය සහ ටැම්පිට විහාර තාක්ෂණයේ සුවිශේෂත්වය සුරැකි කුඩා කලාගාර දෙකක් වශයෙන් හැඳින්විය හැකිය. විශේෂයෙන් ම අරත්තන ටැම්පිට විහාරයේ ඇති සිතුවම් මහනුවර යුගයේ සිතුවම්වලට කදිම නිදර්ශනයක් වශයෙන් ද හඳුනාගත හැකි ය.

**සාකච්ඡාව**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ එළදැත්ත බටහිර ග්‍රාමයේ අරත්තන විහාරය පිහිටා තිබේ. සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාකෙහෙල්වල කැප්පෙටිපොළ ග්‍රාමයේ ශ්‍රී අභයරාජ විහාරය පිහිටා තිබේ. මෙම විහාරයන් දෙකෙහි ම ටැම්පිට විහාරය වෙන ම භූමියකත් විහාරස්ථානයේ සෙසු අංග වෙන ම භූමියකත් පිහිටා තිබේ. අරත්තන විහාරයේ ටැම්පිට ප්‍රතිමා ගෘහය පවතින්නේ එහි විහාරාධිපති හිමි වැඩ සිටින විහාරස්ථානයේ සිට කි.මී. 1ක් පමණ දුරින් තේ වත්තක් මධ්‍යයේ ය. කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරයේ එය පිහිටා තිබෙන්නේ කි.මී. 1/2ක් පමණ දුරින් රබර් වත්තක් මධ්‍යයේ ය. දවුලගල-එළදැත්ත මාර්ගයේ කි.මී. 1ක් පමණ යාමෙන් අරත්තන විහාරයට පිවිසිය හැකිය. මාවනැල්ලේ-රඹුක්කන මාර්ගයේ කි.මී. 11.5ක් පමණ ගිය විට හමුවන කැප්පෙටිපොළ හන්දියේ ශ්‍රී අභයරාජ විහාරය පිහිටා තිබේ.

අරත්තන විහාරයේ වර්තමාන විහාරාධිපති හිමියන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවට අනුව මෙම විහාරයේ ඉතිහාසය වසර 200 කට වඩා වැඩි බව දැන ගැනීමට හැකි විය. මෙහි ඉතිහාසය ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් කළ නාරායන පරපුර සමග සම්බන්ධ වේ. නාරායන පරපුරට උඩරට රජුගෙන් ප්‍රසාද දීමනාවක් ලෙස අරත්තන ගම්වරය ලැබුණු අතර එම පරපුරේ ලී කැටයම් මූලාචාර්යවරයෙක් මෙම ටැම්පිට පිළිමගෙය ඔවුන්ගේ වන්දනා කටයුතු සඳහා සකස් කර තිබෙන බවට ජනප්‍රවාදයේ එයි. අඩි 1 අඟල් 5ක් පමණ අස් වූ ගල්ටැම් පහක් මත පිහිටි මෙම විහාරයේ දිග අඩි 22 අඟල් 4 කි. පළල අඩි 14 අඟල් 2 කි. අඩි 3ක් හෝ 4ක් පමණ උස රන් ආලේපිත දැවමුවා හිඳි බුදුපිළිමයක් පැවතුණ ද මේ වන විට එය සොරකම් කර තිබේ. අද වන විට මෙහි පිට බිත්ති මත සුදු හුනු ආලේප කර තිබේ. නමුත් අතීතයේ පිට බිත්ති මත සිතුවම් පැවති බවට යම් යම් සාක්ෂ්‍ය පරීක්ෂා කිරීමේ දී සොයාගත හැකිවිය. අභ්‍යන්තර බිත්ති මත සහ සිවිලිමේ මහනුවර යුගයේ සිතුවම් දක්නට ලැබෙන නමුත් ඒවා ද මේ වන විට දුර්වර්ණ වී අත. පැරණි ශ්‍රී විභූතිය විදහා දක්වන මෙම පිළිමගෙය අද විහාරයේ දායකයන්ගේ පැමිණීමකින් තොරව තේ වත්තක් මධ්‍යයේ හුදෙකලාව පවතියි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාකෙහෙල්වල ග්‍රාමය මොණරවිල කැප්පෙටිපොළ මහ දිසාවගේ ජන්ම භූමිය වේ. ඔහු බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයට විරුද්ධව 1818 වර්ෂ සිදුවූ ප්‍රථම නිදහස් අරගලයේ ප්‍රධාන නායකයෙකු වීම නිසා බ්‍රිතාන්‍යයන් විසින් ඔහුව අල්ලා හිස ගසා මරා දමන ලදි. සිය සොහොයුරාගේ මරණයෙන් කම්පා වූ මද්දුම බණ්ඩාර කැප්පෙටිපොළ නිලමේ ද අකල් මරණය පත් වූ බව පැවසේ. ඔහුට දරුවන් නොසිටි නිසා ඔහුගේ බිරිඳ වූ ටිකිරි කුමාරි කැප්පෙටිපොළ පරපුරට අයත් වලව්ව පන්සලක් බවට පත් කොට

වේකොළදෙණියේ ශ්‍රී සුමන හිමියන්ට 1855 වර්ෂයේ දී පූජා කර තිබේ.

මෙහි ඇති ටැම්පිට පිළිමගෙය නව විහාර භූමියෙන් මී. 500ක් පමණ දුරින් රබර් වත්තක් මධ්‍යයේ පිහිටා තිබේ. එය කිසිවෙකුගේ අවධානයට ලක් නොවී ජරාවාස වෙමින් පවතී. විහාරස්ථානයේ දායකයෝ පවා මෙය වන්දනා කිරීමට අද වන විට නොපැමිණෙති. අඩි 7ක් උස ගල් ටැම් 21ක් මත මෙය ඉදිකර තිබේ. මෙහි දිග අඩි 20 අඟල් 8ක් ද පළල අඩි 17 අඟල් 10ක් ද වේ. වර්ෂ 1961 දී එවකට විහාරාධිපති වූ මීපිටියේ මේධංකර හිමි මෙහි අලුත්වැඩි කටයුතු සිදුකිරීම නිසා මෙහි ඇති චිත්‍රමත් සිතුවම් සහ පිළිම නූතන ස්වරූපයෙන් යුක්ත වේ. නමුත් ටැම්පිට විහාර සම්ප්‍රදාය මහනුවර යුගයෙන් පසුව විශේෂයෙන් ම ඉංග්‍රීසි පාලන අවධියේ දී පවා විකාශනයට පත් වූ ආකාරය පිළිබඳව විමසා බැලීමේ දී මෙම විහාර ගෙය වැදගත් වේ.

**සමාලෝචනය**

නව විහාර භූමියෙන් බොහෝ සෙයින් ඈත්ව පිහිටා තිබීම නිසා අද වන විට භාවිතයෙන් ඉවත්ව ගොස් ඇති වැදගත් පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි දෙකක් වශයෙන් මෙම අරත්තන සහ ශ්‍රී අභයරාජ විහාරයන්ගේ ටැම්පිට ප්‍රතිමා ගෘහයන් දෙක හඳුනාගත හැකිය. විශේෂයෙන් ම මහනුවර යුගයේ සිතුවම් පවතින ස්ථානයක් වශයෙන් අරත්තන විහාරයේ ප්‍රතිමා ගෘහය වැදගත් වේ. සිතුවම් හා ප්‍රතිමා නිර්මාණයේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් නොමැති වුව ද මහනුවර යුගයේ පසුකාලීනව, විශේෂයෙන් ම මෙරට බ්‍රිතාන්‍ය පාලන අවධියේ පවා ටැම්පිට විහාර සම්ප්‍රදාය විකාශනය වූ ආකාරයට කදිම නිදර්ශනයක් වශයෙන් කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරයේ ටැම්පිට ප්‍රතිමා ගෘහය වැදගත් වේ. අදටත් ජීවමාන ස්වරූපයෙන් වැඳුම් පිදුම් ලබන සෙසු ටැම්පිට විහාරයන් පරිද්දෙන් ම මෙම ප්‍රතිමා ගෘහ දෙක ද උඩරට කලා සම්ප්‍රදාය සුරකි කුඩා කලාගාරයන් වන්නේ ය. එමනිසා ඒවායේ ජීවමාන ගුණය ආරක්ෂා කර කොට මතු පරපුරට සුරක්ෂිතව දායාද කිරීම ජාතික කාර්යයක් වන්නේ ය.

**පරිශීලන නාමාවලිය**


දිසානායක, ගංගා රාජිනී.(2017)*බෞද්ධ විහාරාංග සම්ප්‍රදායේ උඩරට කලාගාරය ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර ඉතිහාසය,සම්ප්‍රදාය හා විකාශය.* කැළණිය: සංකථන පර්යේෂණ කේන්ද්‍රය.

විජයවර්ධන, කුසුම්සිරි.(2010)*ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර.*කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

විජේසූරිය, ගාමිණී.(1999) සංස්.*ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර සම්ප්‍රදාය.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.